## වාරිමාර්ග ජලය අරපරෙස්සම් කිරීමෙන් මහ නියං කාලයේත් අක්කරයකට වී බුසල් 130 ක් ලැබූ වගයි.

# රාජාංගන ගොවීන් නියගය ජයගනී

රාජාංගනය ලංකාවෙ මැතදි ගොඩනැංවූ විශාල වාරිමාර්ග ව්‍යාපාරයක්. මෙය පිහිටා තිබෙන්නේ කළාඔය නිම්නයේයි. ජලාශය අක්කර අඩි 76,000 ක ධාරිතාවකින් යුතුයි. ඉන් වගාකිරීමටකුඹුරු අක්කර 13,300 ක් පමණ අස්වද්ද තිබෙනවා.

නියගය නිසා අවුරුදු කිහිපයක් ගොවි තැන් නොකල ගොවීන් තීරණය කළේ ඊළඟ කන්නයේ (1976 යල) මුළු කුඹුරු ප්‍රමාණ යම වගා කරන්න. එම තත්වයට තුඩුදුන්නේ කන්නය මැදදී මහවැලි ජලය ලැබේ යන බලාපොරොත්තුව. 1976 මාර්තු 10 වනදා අනුරාධපුරයේ රජයේ දිසාපතිගේ මෙහෙයවීමෙන් පැවැති කන්න රැස්වීමේදී රාජාංගනයේ ඉංජිනේරු තැන ජලාශය ඇති ජලය අනුව යල කන් නයට අක්කර 5500 ක් තුන්මස් වී යොද ගොවිතැන් කරන්න කල ඉල්ලීම ඔවුන් පිළි නොගත්තේත් ඒ නියායි. එහිදී දිසා පති තැන ගොවීන්ගේ තීරණයට එකඟ වූහ.

මුලින්ම වැවෙ ජලය වාරිමාර්ග ඇලවලට නිකුත් කරන්න පටන් ගත්තේ අප්‍රියෙල් 01 දා. ඒ වනවිට වැවෙ තිබූ ජල ප්‍රමාණය අක්කර අඩි 42,000 ක් වූ අතර දිනකට වාරිමාර්ග ඇලවලට නිකුත් කරන්නට. කටයුතු කළ ප්‍රමාණය අක්කර අඩි 1000 යි.

නියම කරගත් වගා වැඩ සටහනට අනුව වපුරා අවසන් කර යුතුව තිබුනේ අප්‍රියෙල් 30 වනදා. නමුත් ඊයට නොයෙකුත් බාධා වල් ඇතිවුනා. අප්‍රියෙල් 26 වනවිටත් වගා ණය ලැබී තිබුනේ ගොවීන්ගෙන් 1/4 කට පමණයි. ඒ විතරක් නෙවෙයි ලැබුන බීජ් තර වී ප්‍රමාණවත් වූයේ නැහැ. මේ නිසා නොයෙක් වර්ගවල බිත්තර වී යොද ගන්නට ගොවීන්හට සිදු වුනා. මේ ප්‍රශ්න නිසා අන්තිමේදී වපුරණ අවසාන දිනය මැයි 15 තෙක් දිර්ඝකරන්නට සිදුවුනා.

මේ විදිහට වැඩ කෙරීගෙන යනවිට ගොයම ට සෑහෙන්ට වැවේ තිබෙන වතුර ඇතිවේවිද යන්න කාගෙත් හිතේ පැසවූ ප්‍රශ්නයක්. අන්තිමේදී මේ ප්‍රශ්නයට පිළිතුරු ඉදිරිපත් කලහැකි ඕනෑම කෙනෙකුට සහය දීමට එළඹෙන තත්ත්වයකයි ඔවුන් ඒ වනවිට සිටියේ. මේ බැරෑරුම් තත්ත්වයට පිළියම් යෙදී මට කටයුතු භාර කරනු ලැබුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග ජලය පරි හරනය ක්‍රමවත් කිරීමේ අංශයටයි. මෙම අංශයේ කටයුතු කරන්නේ එම දෙපාර්ත මේන්තුවෙන් තෝරා පත් කරන ලද දක්ෂ නිලධාරීන් පිරිසක්. ඔවුන්ගේ ප්‍රධානියා කේ. ෂන්මුගරාජා නැමැති ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනයි. ඔවුන්ට ඒ වනවිට හක් වටුන ඔය, වව්නිකුලම යන ප්‍රදේශවල මේ විදිහෙ කටයුතු කරල සෑහෙන පලපුරුද්දක් ලබා තිබුන. මේ අය කණ්ඩායමක් රාජාංගනය බලා ගොස් එහි කඳවුරක් පිහිටුවා ගත්තා.

ඔවුනට රාජාංගනය භාර නේවාසික ඉංජිනේරු තැන ඇතුළු සියළුම නිලධාරී පිරිසගේ සහය නොමසුරුව ලැබුනා. ඔවුන් පළමුවෙන් කළේ ඊට පෙර වකවානුවල ජල පාලනය සටහන් පරීක්ෂා කිරීමයි. නමුත් එම සටහන් ක්‍රමවත් ලෙස නොපැවතීම නිසා එතරම් ප්‍රයෝජනයක් ගතහැකි වූයේ නැහැ. ඉතින් ඔවුන් කුඹුරක් කුඹුරක් ගානේ ගොස් පය්, ඇලවේලි, දියබස්නා ඇලවල් යනාදී වේ හැම එකක්ම පරීක්ෂා කලා. මෙහිදී ඔවුන්ට පෙනිගිය ප්‍රධාන අඩුපාඩු කම් තුනක්.

(අ) ප්‍රධාන හා ශාඛා වාරිමාර්ග ඇලවල් හොඳින් පැවතුනත්, ගොවි මහතුන්ගේ පාලනය යටතේ පවතින කෙත් ඇලවල් වල තත්ත්වය අසතුටු දායක බව.

(ආ) ලියදි පුරවා ජලය රඳවා තබා ගැනීම නිසා ගොයම් පැලයට අවශ්‍ය ජල ප්‍රමාණයට වඩා විශාල ජලය ප්‍රමාණයක් අපතේ යන බව.

(ඇ) රාජාංගනය කුඹුරුවල ප්‍රධාන දිය බස්නා ජල මාර්ගය වූ කලා ඔයේ, එසේ නිස්කාරනේ ගලායන විශාල වාරිමාර්ග ජලප්‍රමාණයක් ඇති බව යන දැයි.

අනතුරුවඅප්‍රියෙල් 30 වන විට රාජාංගනය වැවෙන් නිකුත් කරන ජලය 20% කපා හැරි ඔවුන් මැයි මස 16 වනද වනවිට තවත් 50% කින් නිකුත් කරන ජලය කපා හැරියා. එතැන් සිට ජලය නිකුත් කරන ලද්දේ දින කිහිපයකට වරක්. මෙය හැඳින් වූයේ 'මුර'ක්‍රමයනමින්. ඒ අනුව දිනකට නිකුත් කල ජල ප්‍රමාණය වූයේ අක්කර අඩි 375 ක් පමණයි. ඒ සමගම අනවසර හා අවලංගු කට්ටි ඉඩම් වල අක්කර 1914 කට ජලය සැපයීම නතර කරන්නට සිදුවූවා. මෙය ව්‍යාපාර කළමණාකරු, පලදාවර්ධන කමිටු, ගොවිකාරක සභා ගන්නා සාමූහික තීරණයක්.

නමුත් ගොවි මහතුන් එකවරම මේ වැඩ පිළිවෙලට කැමැත්තක් දක්වූයේ නැහැ. නිලධාරීන්ට සිදුවුනා ඔවුනුත් ගොවි මහත් වරුන් අතර සාකච්ඡා යනාදිය මගින් 'මුර' ක්‍රමයෙන් වන යහපත වටහා දීමට. එහිදී පෙන්වා දුන්නා ගොයමට අවශ්‍ය වන්නේ පසේ එක්තරා තෙතමනයක් තිබීම පමණක් ප්‍රමාණවත් බව. ඒ විතරක් නෙවි පසේ වාතාශ්‍රයට ඉඩ ලබාදීමෙන් එය සරු කර වනවා. ඒ වගේම ජලය අරපරෙස්සම් වීම නිසා වගාකරගත හැකි කුඹුරු ප්‍රමාණය විශාලයි. ඒ වගේම ඉතාම වැදගත් කරුණක් තමයි ගොවීන්ට සමූහයක් හැටියට එකට ගොවිතැන් කටයුතු වලට බැසීමට එයින් අනුබලයක් ලැබීම. එයින් මුළු ප්‍රදේශයේම එකම වගා වැඩසටහනකට අනුව ගොවිතැන් කටයුතු කරන්නට ලැබෙනවා.

කෙසේ වුනත් මැයි මස අග වනවිටත් වැපිරීම් කටයුතු කරගෙන යමින් තිබුන බව ඔවුන්ට පෙනී ගියා. නැවතත් ගොවිතැන් කටයුතු ගැන සමාලෝචනයක් කිරීමට ඔවුන් රැස්වීමක් කැඳවූවා. මෙම රැස්වීම පැවැත්වූයේ මැයි මස 26 ද. එහිදී ගොවීනට දන්වා සිටියා කල් පමාවූ අක්කර 1359 අත්හැර දැමීමට කටයුතු කරන්න කියා. එසේ නොකල හොත් ගොවිතැන් කටයුතු පමානොවූ අක්කර 9555 වත් බේරා ගැනීමට නොහැකි වන බව දන්වූහ. නමුත් ඊට ගොවීන්ගේ කැමැත්තක් තිබුනේ නැහැ.

මෙහිදී තතු සොයන්න පැමිණි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැන රාජාංගනයේ වගා කටයුතු ගැන පරීක්ෂණයක් පවත්වා පලදාවර්ධන කමිටු හා ගොවි-කාරක සභාවල නියෝජිත වරුද, එසේම නිලධාරීන්ද සමග සාකච්ඡාකර එම කල් පමාවූ කුඹුරු බේරා ගැනීමට වැවේ සොරොව්ව වත් පහළ ජලයත් කන්න අවසානයේ සති දෙකකට පොම්ප යොද සැපයීමට කටයුතු කළා.

මෙසේ, ක්‍රමවත්ව ජලය වී ගොවිතැන් කටයුතුවලට භාවිතා කිරීමටසිදුවීමෙන් 1976 යල කන්නයේදී ඔවුන්ට කුඹුරු අක්කර දස දහසකට වැඩි ප්‍රමාණයක අස්වනු කපා ගැනීමට හැකි වුනා. සමහරක් කුඹුරුවල අක්කරයකට බුසල් 130 ක් පවා ලබා ගත හැකිවුනා. වෙනද රාජාංගනය ව්‍යාපාරයේ වැඩියෙන්ම ලබා තිබුනේ සාමාන්‍ය වශයෙන් බුසල් 55.4 ක් පමණයි. නමුත් මෙවර එම ප්‍රමානය වූයේ බුසල් 57.5 ක්.

දැන් මේ ජයග්‍රහණ තහවුරු කරගන්න තවත් පියවරක් ඔවුන් ඉදිරියට ගිහිල්ලා. ක්‍රමවත්ව වාරිමාර්ග ජලය ප්‍රයෝජනයට ගැනීම ගැන දැන් ගොවීන් තුල ලොකු විශ්වාසයක් තිබෙනවා. මේ නිසා වැඩ පිළිවෙල දිගටම ඉදිරියට ගෙනියන්න ඔවුන් අදහස් කරනවා. ඒ විතරක් නෙමෙයි 1977 යල කන්නයේදී

උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීමට ගොවීන් උනන්දු කරවීමටත්. එතන් ඇලවල්වල ජලය සටානව හා ක්‍රමවත්ව බෙදු ගැනීමෙන් වාරිමාර්ග ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමටත් ගොවීන් අතර සාමූහික භාවය වර්ධණය කිරීමේ අරමුණක් ඇතිව තරඟ වගා වැඩ පිළිවෙලක් අරඹා තිබෙනවා. මේ තරඟය සීමා වන්නේ වී වගාවට පමණයි.

මෙම තරඟයට රාජාංගනය ව්‍යාපාරයේ දකුණු හා වම් ඉවුරුවල කුඹුරු අක්කර 40–50 වනසේ කණ්ඩායම් වලට බෙදු තිබෙනවා. ඒ අනුව තරඟයට සහභාගිවන මුළු කණ්ඩායම් ගණන 277 යි. මෙහිදී ප්‍රදේශයේ වර්ෂාපතනය සැලකිල්ලට ගනිමින් කුඹුරුවලට අවශ්‍ය වාරිමාර්ග ජලය ප්‍රමාණය නිකුත් කරනවා. එක් එක් කණ්ඩායමට එක් එක් ඇල මගින් සපයන ජලය මනිනු ලබයි. එසේම තරඟ කණ්ඩායට නිෂ්පාදනය කරන වී කියන්ෙදි මනිනුලැබේ. එට කට යුතු සඳහා පලදාවර්ධන කමිටු මගින් කිහිප දෙනකුගෙන් යුතු නිරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ඇත. ජලය බෙදු හැරීමේ වග කීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව පවතින අතර, සෙසු යෙදවුම් බෙදු දීම පලදාවර්ධන කමිටු සතු කාර්ය භාරයක් වේ.

මෙම තරඟයේ ජයග්‍රාහක කණ්ඩායම්වලට පොදුවේ ප්‍රයෝජනයට ගැනීමට කෘෂිකාර්මික උපකරණ ත්‍යාග වශයෙන් ලැබේ. මුල් තැග්ග රෝද දෙකේ ට්‍රැක්ටර යන්ත්‍රයක්. මෙම තරඟයේ ජයග්‍රාහකයින් පිළිබඳ විස් තරයක් අප ඔබට ගොවිජනතාවෙන් පසුව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

# ලීපට දර නැහැ !

ආහාර පිසීමට නොයෙකුත් උපකරණ දැන් නිපදවූවත් ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් පමණ තවමත් ආහාර පිසින්-නේ දර වලින්. ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල ජනතාව මෙහිලා මුල් තැන් ගන්නවා.

ජනගහණය වැඩිවත් ම කැලෑ එළිවීමත් සමඟ දර සොයා ගැනීමත් මහත් ප්‍රශ්නයක් වෙලා. අපේ ගම්බද කාන්තාවන් ඉස්සර අවට කැලෙන් දර ටිකක් සොයා ගත්තත් දැන් ඈත එපිට ඉඳලා ඔවුන් දර මිටි කර-තියන් එනු දැක්ම සුලභ දර්ශනයක්. නේපාල යේ ගැමියන් කලින් මේ සඳහා වැය කලේ දිනකට පැයක් දෙකක් වුව ද දැන් ඔවුනට මේ සඳහා සතියකට දිනක් ම ගත කරන්න වෙලා. දර සොයා කැලෑ වදින්නන්ගෙන් ආරක්ෂිත කැලෑ බේරා ගන්න ඉන්දියාවේ විශේෂ ආරක්ෂා බලකාය මෙන් ම සංචාරක උසාවිත් පිහිටුවලා.

**ලෝකයේ දිනකට කපනු ලබන ගස්වලින් අඩක් දර සඳහා ගනු ලැබෙනවා. ගස් කැපීමෙන් පසට වන හානිය අතිමහත්. මේ නිසාවෙන් පසුගිය අවුරුදු සියය තුළ ජල හා සුළං සෝදා පාළුව නිසා ලෝකයේ වගා බිම් වලින් කාලක් පමණ විනාශ වී ඇතැයි ගණන් බලා තියෙනවා.**

දර හිඟය නිසා ඉන්දියාව, පකිස්තානය, මිසරය, ඉතියෝපියාව, ඉරාකය, බොලිවියාව වැනි රටවල වේලූ ගොම වැනි සත්ව මළ පහ ආහාර පිසීමට ගන්නවා. ඉන්දියාවේ පමණක් වසරකට මෙවැනි මළ පහ ටොන් කෝටි 30 ත් 40 ත් අතර ප්‍රමාණයක් මේ සඳහා ගන්නවා. මෙය එරට පෝර අවශ්‍යතා වයන් ගෙන් තුනෙන් එකක්. මෙය කෙටි කාලීන අවශ්‍යතාවයක්, දීර්ඝ කාලීන වස්තු වක් වනසන අයුරු දක්වෙන කදිම නිදසුනක්. මන්ද, සත්ව මළ පහ පසෙහි ගුණ වැඩි කරන්නක් නිසා.

කැලෑ කැපීම ලෝකයේ ස්වාභාවික පැවැත් මට මහ තර්ජනයක්, බව හැමෝම පිළිඅරන්. ලීපට දමන දර කැල්ල මිනිස් පැවැත්මට කරන හානිය සුළු නොවන නිසා එක්සත් ජාතින් ගේ පරිසර සැලැස්ම දර ප්‍රශ්නයට පිළිතුරු හොයන්න උත්සාහ කරනවා. 1977 මේ වර්ෂය මේ සඳහා කැප කරලා.